# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.04.22 පැය 0550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/802 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**

**01. මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් අවශ්‍ය කර සිටි සැකකරුවෙකු තියුණු ආයුධ සමග අත්අඩංගුවට - පොලිස් විශේෂ කාය⁣ර් බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.04.21 වන දින පොලිස් විශේෂ කායර් බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සිදුකළ සෝදිසි මෙහෙයුමකදී සැකකටයුතු පුද්ගලයෙකු පරීක්ෂා කර ඇති අතර, සැකකරු සන්තකයේ තිබී තියුණු ආයුධ තුනක් සොයාගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුසම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විමශර්නයේදී, 2025.02.19 වන දින කොටහේන පොලිස් වසමේදි පුද්ගලයෙකු තියුණු ආයුධ වලින් පහරදී ඝාතනය කිරීමේ ආපරාධය සම්බන්ධයෙන් පොලිසියට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත. සැකකරු විසින් අපරාධය සඳහා භාවිතා කල බවට සැකකරන කඩුවක් ද බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ මහල් නිවාස සංකීණර්යක් ආසන්නයේ සඟවා තිබියදී එම නිලධාරින් විසින් සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන කොටහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු වැඩිදුර විමශර්න සඳහා කොටහේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති අතර කොටහේන පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය**

2025.04.22 වන අද දින අළුයම් කාලයේ මාදම්පිටිය පොලිස් වසමේ මිහිජය සෙවණ මහල් නිවාස සංකීණර්ය ආසන්නයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හැෂ් මත්ද්‍රව්‍ය කිලෝ 02 ග්‍රෑම් 34 මිලිග්‍රෑම් 35 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි. වැටලීමට අදාල විඩියෝ පටයක් මේ සමඟ යොමුකරමි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.**

2025.04.22 වන අද දින අළුයම් කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ ගැමුණුපුර ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද

තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 42 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිස් ස්ථානය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**